


# සිංහරාජයේ අතරමං වි

ඔවිඳි උන්හසි

# සිංහරාජයේ
# අතරමං ව

ඔවිඳි උන්හසි

**කතෘගේ වෙනත් කෘති**

ඇස් පේන්නැති කූඹි රාල ISBN 978-624-206-736-0
මලී ISBN 978-624-206-736-7
කළුවර ගෙදර ISBN 978-624-208-398-8

මාහාමායා බාලිකා විදුහල, මහනුවර

5 ශ්‍රේණිය E

ISBN - 978-624-211-069-1

ප්‍රකාශිත දිනය :- 2026-05-10

# පිදුම

**මා මෙන්ම පොත් කියවා**

**රස විඳීමට කැමති**

**බාල, තරුණ, මහළු**

**මේ සියළු ම පාඨකයන් හට**

**සතුටින් පුදමි...**



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එකෝමත් එක ගමක සමිඳු කියලා පොඩි පිරිමි ළමයෙක් හිටියා. එයා පාසල් වැඩ කිරීමට හරිම දක්ෂයි. ඒ නිසා සමිඳුගේ දෙමාපියන් සතුටු වුණා. සමිඳු පාසල් වැඩ කිරීමට දක්ෂයි වගේ ම විද්‍යාවටත් හරිම දක්ෂයි.



**එක දවසක් සමිඳුගේ පන්ති භාර ගුරුතුමී බාලදක්ෂ කඳවුරක් ගැන ඔවුන්ව දැනුවත් කළා. ඒ සිංහරාජ වනාන්තරය අවට පරිසරය නැරඹීමට යාමටයි.**





ඔන්න ඉතින් දවසින් දවස ගෙවී ගොස් ඒ දිනය උදා වුණා. හැමෝ ම උදේ ම බසයට ගොඩ වුණා.

මඟ දිගට විනෝද වෙමින් පැමිණි කණ්ඩායම ටිකෙන් ටික කඳවුරට ළඟා වුණා.

සිංහරාජ වනාන්තරය කියන්නේ ඉතා ලස්සන වනාන්තරයක්. ලස්සන ගස්වැල්, ලස්සන මල්, දුලබ පැළෑටි හා ගස් වගේ ම, දුලභ සතුන් ද, භයානක සතුන් ද උරගයින් ද ඉන්න මේ වනාන්තරය තව තවත් ලස්සන කරයි.

බසයෙන් බැසගත් පාසැල් බාල දක්ෂයින් එක කණ්ඩායමක ළමයි පහ බැගින් ගුරුතුමිය සමඟ වනාන්තරයට ඇතුලට ගමන් කළා.

ටික දුරක් යද්දී සමිඳුගේ කණ්ඩායමේ දමිත් බිම එතී තිබුණු වැලක කකුල පැටලී වැටුණා.

මෙන්න දමිත්ගෙ දකුණු කකුලෙන් හොඳටම ලේ එනවා.

කණ්ඩායමේ අයට ප්‍රථමාධාර පෙට්ටිය ගේන්න අමතක වෙලා.

සමිඳු කොහොඹ ගහක් දැක්කේ එතකොට. කොහොඹ අත්ත කඩාගෙන යාළුවාගේ කකුලේ ගෑවා.



ඉන්පසු සමිඳු වටපිට බැලුවා ගුරුතුමීත් අනික් කණ්ඩායම් නැති බව සමිඳුට තේරුණා.
සමිඳුගේ යාළුවා වන සනුක මෙහෙම ඇහුවා.

"අපි දැන් මොකද කරන්නේ? මං හිතන්නේ අපි අතරමං වෙලා වගේ. සමිඳු අපි ටිකක් යහළුවන් ඉන්නවාද කියලා බලමු ද?"
"හොඳයි අපි එහෙම කරමු. දැන් හවස් වෙලානේ. අපිට යාලුවෝ ඉන්න තැනත් හොයාගන්න බැරි වෙයි. ඒ නිසා අපි හෙට හොයන්න යමු."

හා එහෙම නම් අපි හෙට යමු.

දැන් හොඳටම කළුවරත් වෙලානේ, අපි කොහොම ද එළියක් නැතුව ඉන්නේ, ගිනි මැලයක්වත් ගහ ගන්න තිබ්බ නම්, සීතලත් එක්ක. ධනුක කිව්වා.

මතකද අපිට බාලදක්ෂ වලට ගින්දර පත්තු කරන හැටි ඉගැන්නුවා.

ඔව්... ඔව්...

එහෙනම් මම කියන දේවල් ගේන්නකෝ...

හොඳයි අපි මොනවද ගේන්න ඕනි.

ඔයාලා වට පිටාවෙන් මෙන්න මේවා ගේන්න. වේලිච්ච කෝටු කුඩා ගල් සහ කොළ රොඩු. දුරට යන්න එපා තනියම.

හරි අපි ගේන්නම් ඔන්න සමිදු ඔයා කිව්ව දේවල් හරි දැන් කෝටුයි කොළ රොඩුයි මැදට දාන්නකෝ ඊට පස්සේ ගල් කැට දෙකක් එකට අරගෙන රත් වෙනකම් හොඳින් අතුල්ලන්න.
මොකක් ! ගින්දර නේද?

දැන් ගිනි මැලයකුත් ගහ ගත්තනේ.

අපි කොහෙද රෑට නිදාගන්නේ?

ආ ඔයාලට පේනවා නේද අර ගස්. අපි ඒ ගස් උඩ අට්ටාලයක් හදමු ද?

ඒ කොහොම ද? මනුක ඇසුවේ ය.

දී දඬුයි වැල් පොටවල් ගේන්නකෝ.



මෙන්න මෙහෙමයි අට්ටාලය හදන්නේ.
ඊට පස්සේ වැල් වලින් ගැට ගහන්න.
දැන් ඉතින් නිදාගන්න යහළුවනේ සුභ රාත්‍රියක් වේවා.

පසු දින උදා විය. සමිඳු උදෑසන නැගිට්ටේය. පස්සේ සමිඳු යාලුවන් ද නැගිට්ටුවේ ය. සමිඳු සමග යහළුවන් උයන්න ලෑස්ති වුණෝය.

ආහාර ගත් යහළුවන් පස්දෙනා ම තම අනිත් යහළුවන් සොයා ගැනීමට වෙහෙස විය. ඔවුන්ට පාර සොයා ගැනීමට අපහසු විය. එහෙත් කොහොම හරි පාර සොයා ගත්හ. එහෙත් යාලුවන් ළඟට යෑමට නොහැකි විය.

රෑ බෝ වූ පසු එදින ද රාත්‍රිය ගෙවීමට යහළුවෝ තීරණය කළෝ ය.

අපි අද මොනව ද කන්නේ? අපේ ඔක්කොම කෑමත් ඉවර උනානේ.

ආ ඔයාලට පේනවා නේද අර පොකුණ.

සමිඳු අපි මාළු ටිකක් අල්ලමු. ඊට පස්සේ ගිනි මැලයක් ගසමු. ඊට පස්සේ අපි විනෝද වෙමු.

ඒක නම් හොඳ අදහසක්

හරි දැන් අපි නිදාගමු. හොඳයි, යහළුවනේ සුභ රාත්‍රියක්.

පසු දින උදෑසන අවදි වී ඉතිරි ආහාර රැගෙන තම යහළුවන් සොයා ගැනීමට උදෑසන ම ගමන පටන් ගත්හ. එදිනත් වෙහෙස විය. අතරමං වූ තම කණ්ඩායම් සොයා ගැනීමට බාල දක්ෂ කණ්ඩායම කැලයට ඇතුළු විය.

මේ අතර සමිඳු බර කල්පනාවක සිටින්නට විය.


''සමිදු බර කල්පනාවක''. මනුක අසන්නට විය

ඔව් ඔව් මම කල්පනාවක තමයි හිටියේ. ඔයාලට මතකද විද්‍යා සර් උගන්නපු ආලෝක පාඩම.

ඔව් සමිඳු, අපි ඒකට කලේ කණ්ණාඩිය ගැන පාඩමක්. ආ... අර අව්වට කන්නාඩියක් අල්ලපු එක ද?

ඔව් ඔව්, ඒක තමා. අපිට පුළුවන් කන්නාඩියක් අව්වට අල්ලලා තව තැනකට පණිවිඩයක් දෙන්න. කාලගු හරි කණ්ණාඩියක් තියෙනව ද?

ඔව් මහේෂ් හොඳ වෙලාවට තියෙනවා. හරි එහෙනම් මට ඒ කණ්ණාඩිය දෙන්න.



හොඳයි, දැන් අපි උස තැනකට යමු ඊට පස්සේ අපි කණ්ණාඩිය හිරු එළියට අල්ලමු. එතකොට අපි ඉන්න තැන අපේ යාළුවන්ට හොයාගන්න පුළුවන් වෙයි.

හරි අපි එහෙම කරමු.

ඒ දුටු ළමෝ ගුරුතුමියට ඒ එළිය පෙන්වීය.

ආන් දැන් ඔයාලට පේනවා ද අර හිරු එළිය. සමහරවිට අපේ සමිඳුගේ කණ්ඩායම එතැන ද දන්නේ නෑ ඉන්නේ?


අපි එතනට ගිහින් බලමු.

හොඳයි,  අපි එතනට ගිහින් බලමු.

යාලුවනේ අර එන්නේ අපේ යාළුවෝ.

ඔව් ම තමා....

අනේ අපි බයෙන් හිටියේ ඔයාලව සතෙක්වත් කෑව ද කියලා.



අපිට එහෙම වෙන්න තිබ්බා. අපි බේරුණේ සමිඳු හින්දා.

සමිඳු ඔයාට බොහොම ස්තූතියි. ඒක සුළු දෙයක්.

සියළු යහළුවන් ගුරුතුමී සමඟ ආපසු කඳවුර වෙත ගියා.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

**ISBN -978-624-211-069-1**